(අටවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

**අංක 81.]**

# පාර්ලිමේන්තුවේ කාර්ය සටහන්

**2016 ජූනි මස 24 වැනි සිකුරාදා පූ. භා. 10.30 ට**

## පැමිණි මන්ත්‍රීන් :

ගරු **සෙල්වම් අඩෛක්කලනාදන් මහතා,** නියෝජ්‍ය කාරක සභාපතිතුමා

---

ගරු **රනිල් වික්‍රමසිංහ මහතා,** අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා

ගරු **තලතා අතුකෝරල මහත්මිය,** විදේශ රැකියා අමාත්‍යතුමිය

ගරු **වජිර අබේවර්ධන මහතා,** ස්වදේශ කටයුතු අමාත්‍යතුමා

ගරු **ජෝන් අමරතුංග මහතා,** සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යතුමා සහ ඉඩම් අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) සරත් අමුණුගම මහතා,** විශේෂ කාර්යභාර අමාත්‍යතුමා

ගරු **ගයන්ත කරුණාතිලක මහතා,** පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා

ගරු **ලක්ෂ්මන් කිරිඇල්ල මහතා,** උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා

ගරු **මනෝ ගනේසන් මහතා,** ජාතික සහජීවනය, සංවාද හා රාජ්‍ය භාෂා අමාත්‍යතුමා

ගරු **දයා ගමගේ මහතා,** ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යතුමා

ගරු **නිමල් සිරිපාල ද සිල්වා මහතා,** ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා

ගරු **පලනි දිගම්බරම් මහතා,** කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යතුමා

ගරු **දුමින්ද දිසානායක මහතා,** කෘෂිකර්ම අමාත්‍යතුමා

ගරු **එස්. බී. නාවින්න මහතා,** අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා

ගරු **ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා,** තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යතුමා

ගරු **ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා,** විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා

ගරු **රිසාඩ් බදියුදීන් මහතා,** කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා

ගරු **ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා,** රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යතුමා

ගරු **චන්ද්‍රානි බණ්ඩාර මහත්මිය,** කාන්තා හා ළමා කටයුතු අමාත්‍යතුමිය

ගරු **ෆයිසර් මුස්තාපා මහතා,** පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා

ගරු **අනුර ප්‍රියදර්ශන යාපා මහතා,** ආපදා කළමනාකරණ අමාත්‍යතුමා

ගරු **සාගල රත්නායක මහතා,** නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යතුමා

ගරු **අර්ජුන රණතුංග මහතා,** වරාය හා නාවික කටයුතු අමාත්‍යතුමා

ගරු **පාඨලී චම්පික රණවක මහතා,** මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යතුමා

ගරු **මලික් සමරවික්‍රම මහතා,** සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා,** සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා

ගරු **ඩී. එම්. ස්වාමිනාදන් මහතා,** බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යතුමා

ගරු **රවුෆ් හකීම් මහතා,** නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යතුමා

ගරු **අබ්දුල් හලීම් මහතා,** තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යතුමා

ගරු **කබීර් හෂීම් මහතා,** රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමා

ගරු **පී. හැරිසන් මහතා,** ග්‍රාමීය ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍යතුමා

ගරු **ෆීල්ඩ් මාර්ෂල් සරත් ෆොන්සේකා මහතා,** ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යතුමා

ගරු **වසන්ත අලුවිහාරේ මහතා,** කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **මොහාන් ලාල් ග්‍රේරු මහතා,** උසස් අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඩිලාන් පෙරේරා මහතා,** මහාමාර්ග රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **නිරෝෂන් පෙරේරා මහතා,** ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය,** නගර සැලසුම් හා ජල සම්පාදන රාජ්‍ය අමාත්‍යතුමිය

ගරු **විජයකලා මහේස්වරන් මහත්මිය,** ළමා කටයුතු රාජ්‍ය අමාත්‍යතුමිය

ගරු **රුවන් විජයවර්ධන මහතා,** ආරක්ෂක රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **දිලිප් වෙදආරච්චි මහතා,** ධීවර හා ජලජ සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **රවීන්ද්‍ර සමරවීර මහතා,** කම්කරු හා වෘත්තීය සමිති සබඳතා රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **සුජීව සේනසිංහ මහතා,** ජාත්‍යන්තර වෙළඳ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **වසන්ත සේනානායක මහතා,** වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඒ. එච්. එම්. ෆවුසි මහතා,** ජාතික ඒකාබද්ධතා සහ ප්‍රතිසන්ධාන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **අශෝක් අබේසිංහ මහතා,** ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ලසන්ත අලගියවන්න මහතා,** මහානගර හා බස්නාහිර සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ෆයිසාල් කාසිම් මහතා,** සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **දුනේෂ් ගන්කන්ද මහතා,** ආපදා කළමනාකරණ නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) අනෝමා ගමගේ මහත්මිය,** ඛනිජ තෙල් සම්පත් සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමිය

ගරු **අනුරාධ ජයරත්න මහතා,** මහවැලි සංවර්ධන හා පරිසර නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **සුමේධා ජී. ජයසේන මහත්මිය,** තිරසර සංවර්ධන හා වනජීවී නියෝජ්‍ය අමාත්‍යතුමිය

ගරු **පාලිත කුමාර තෙවරප්පෙරුම මහතා,** අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා,** විදේශ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **එච්. ආර්. සාරතී දුෂ්මන්ත මහතා,** අධිකරණ නියෝජ්‍ය අමාත්‍යතුමා සහ බුද්ධශාසන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **මනූෂ නානායක්කාර මහතා,** විදේශ රැකියා නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **කරුණාරත්න පරණවිතාන මහතා,** පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **සුසන්ත පුංචිනිලමේ මහතා,** රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **අජිත් පී. පෙරේරා මහතා,** විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ලක්ෂ්මන් වසන්ත පෙරේරා මහතා,** වැවිලි කර්මාන්ත නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **අරුන්දික ප්‍රනාන්දු මහතා,** සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **තාරානාත් බස්නායක මහතා,** විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **රන්ජන් රාමනායක මහතා,** සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **නිමල් ලාන්සා මහතා,** ස්වදේශ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඉරාන් වික්‍රමරත්න මහතා,** රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඩුලිප් විජේසේකර මහතා,** තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

---

ගරු **හෙක්ටර් අප්පුහාමි මහතා**

ගරු **තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**

ගරු ජේ. සී. අලවතුවල මහතා

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා

ගරු රංජිත් අලුවිහාරේ මහතා

ගරු අ. අරවින්ද් කුමාර් මහතා

ගරු ජේ. එම්. ආනන්ද කුමාරසිරි මහතා

ගරු වේලු කුමාර් මහතා

ගරු නාලක ප්‍රසාද් කොලොන්නෙ මහතා

ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා

ගරු චන්දිම ගමගේ මහතා

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා

ගරු නිහාල් ගලප්පත්ති මහතා

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා

ගරු එඩ්වඩ් ගුණසේකර මහතා

ගරු එස්. එම්. චන්ද්‍රසේන මහතා

ගරු සිසිර ජයකොඩි මහතා

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා

ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා

ගරු ලකී ජයවර්ධන මහතා

ගරු ප්‍රේමලාල් ජයසේකර මහතා

ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා

ගරු ක. තුරෙයිරෙත්නසිංහම් මහතා

ගරු එම්. එස්. තෞෆික් මහතා

ගරු සිරිනාල් ද මෙල් මහතා

ගරු අනුර දිසානායක මහතා

ගරු මයන්ත දිසානායක මහතා

ගරු විමලවීර දිසානායක මහතා

ගරු වීරකුමාර දිසානායක මහතා

ගරු ඩග්ලස් දේවානන්ද මහතා

ගරු මොහොමඩ් නවවි මහතා

ගරු වාසුදේව නානායක්කාර මහතා

ගරු බුද්ධික පතිරණ මහතා

ගරු කේ. කේ. පියදාස මහතා

ගරු සුජිත් සංජය පෙරේරා මහතා

ගරු අශෝක ප්‍රියන්ත මහතා

ගරු එස්. ප්‍රේමරත්න මහතා

ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මහතා

ගරු තාරක බාලසූරිය මහතා

ගරු විජිත බේරුගොඩ මහතා

ගරු එස්. එම්. මරික්කාර් මහතා

ගරු සෙය්යිඩ් අලී සාහීර් මවුලානා මහතා

ගරු ඉම්රාන් මහරූෆ් මහතා

ගරු අබ්දුල්ලාහ් මහ්රූෆ් මහතා

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා

ගරු තිලක් මාරපන මහතා

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා

ගරු එස්. සී. මුතුකුමාරණ මහතා

ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි

ගරු බිමල් රත්නායක මහතා

ගරු මුජිබුර් රහුමාන් මහතා

ගරු හර්ෂණ රාජකරුණා මහතා

ගරු වමල් රාජපක්ෂ මහතා

ගරු ගාමිණී ලොකුගේ මහතා

ගරු ජානක වක්කුඹුර මහතා

ගරු (ආචාර්ය) ජයම්පති වික්‍රමරත්න මහතා

ගරු ඒ. ඒ. විජේතුංග මහතා

ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මහත්මිය

ගරු ලක්ෂ්මන් ආනන්ද විජේමාන්න මහතා

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය

ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය

ගරු චමින්ද විජේසිරි මහතා

ගරු හේෂාන් විතානගේ මහතා

ගරු කුමාර වෙල්ගම මහතා

ගරු එස්. ශ්‍රීතරන් මහතා

**ගරු ශාන්ති ශ්‍රීස්කන්දරාසා මහත්මිය**

**ගරු සන්දිත් සමරසිංහ මහතා**

**ගරු රාජවරෝදයම් සම්පන්දන් මහතා,** පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා

**ගරු එම්. එච්. එම්. සල්මාන් මහතා**

**ගරු මුත්තු සිවලිංගම් මහතා**

**ගරු සිවශක්ති ආනන්දන් මහතා**

**ගරු එම්. ඒ. සුමන්තිරන් මහතා**

**ගරු මාවෙ සෝ. සේනාධිරාජා මහතා**

**ගරු චතුර සංදීප සේනාරත්න මහතා**

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**

**ගරු විජිත හේරත් මහතා**

ධම්මික දසනායක මහතා, පාර්ලිමේන්තුවේ මහ ලේකම්

නීල් ඉද්දවල මහතා, කාර්ය මණ්ඩල ප්‍රධානී සහ පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම්

කුෂානි රෝහණදීර මහත්මිය, සහකාර මහ ලේකම්

ටිකිරි කේ. ජයතිලක මහතා, සහකාර මහ ලේකම්

**කල්තැබීම අනුව පාර්ලිමේන්තුව රැස්විය. නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනාරූඪ විය.**

**1. ලිපිලේඛනාදිය පිළිගැන්වීම :** (1) පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමා විසින් 2013 වර්ෂය සඳහා තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව පිළිගන්වා, එම වාර්තාව අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(2) ස්වදේශ කටයුතු අමාත්‍යතුමා විසින්—

(i) 2015 වර්ෂය සඳහා මුලතිව් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වාර්ෂික කාර්යසාධන වාර්තාව හා ගිණුම්; සහ

(ii) 2015 වර්ෂය සඳහා මඩකලපුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වාර්ෂික කාර්යසාධන හා ගිණුම් වාර්තාව

පිළිගන්වා, එම වාර්තා අභ්‍යන්තර පරිපාලනය හා රාජ්‍ය කළමනාකරණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(3) පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමා විසින් 2015 වර්ෂය සඳහා රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ වාර්ෂික කාර්යසාධන වාර්තාව හා ගිණුම් පිළිගන්වා, එම වාර්තාව අභ්‍යන්තර පරිපාලනය හා රාජ්‍ය කළමනාකරණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(4) පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමා විසින් 2015 වර්ෂය සඳහා වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශයේ කාර්යසාධන වාර්තාව පිළිගන්වා, එම වාර්තාව ප්‍රවාහනය හා සන්නිවේදනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(5) පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමා විසින් 2012 වර්ෂය සඳහා සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියේ වාර්ෂික වාර්තාව පිළිගන්වා, එම වාර්තාව තරුණ, ක්‍රීඩා, කලා හා උරුමයන් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**2. පෙත්සම්** :

තණමල්විල, බෝදගම පාර යන ලිපිනයෙහි පදිංචි ඩී. එම්. ගුණසේන මහතාගෙන් ලැබුණු 2016.02.28 දිනැති පෙත්සම ගරු ජේ. එම්. ආනන්ද කුමාරසිරි මහතා විසින් පිළිගන්වන ලදී.

අංක 25අ දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගය යටතේ එම පෙත්සම, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට යොමු කරන ලදී.

**3. තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනත් කෙටුම්පත :** කල් තබන ලද විවාදය තවදුරටත් පවත්වනු පිණිස නියෝගය කියවන ලදී. ඊට අදාළ ප්‍රශ්නය (2016 ජූනි 23),__

''පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතුය''යි ප්‍රශ්නය යළිත් සභාභිමුඛ කරන ලදින්, විවාදය තවදුරටත් පවත්වන ලදී.

''ගරු ජේ. එම්. ආනන්ද කුමාරසිරි මහතා මූලාසනාරූඪ විය යුතුය''යි මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යතුමා යෝජනා කළේය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ. භා. 12.35 ට ගරු ජේ. එම්. ආනන්ද කුමාරසිරි මහතා මූලාසනාරූඪ විය.)

''ගරු ලකී ජයවර්ධන මහතා මූලාසනාරූඪ විය යුතුය''යි උසස් අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා යෝජනා කළේය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ. භා. 1.35 ට ගරු ලකී ජයවර්ධන මහතා මූලාසනාරූඪ විය.)

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවැනි වර කියවන ලදී.

''පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතුය''යි පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමා යෝජනා කළේය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

තදනන්තරව පාර්ලිමේන්තුව සම්මුති මාර්ගයෙන් කාරක සභාවකට පරිවර්තනය විය.

(කාරක සභාවේදී)

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා මූලාසනාරූඪ විය.

1 වැනි වගන්තිය

පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමා යෝජනා කළ සංශෝධනයක් : 1 වැනි පිටුවේ 11 වන පේළියේ සිට 15 වන පේළිය දක්වා ඇති පේළි (ඒ පේළි දෙක ද ඇතුළත් ව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

"ලුහුඬු නාමය සහ ක්‍රියාත්මකවීමේ දිනය.

1. (1) මේ පනත 2016 අංක දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

(2) මේ වගන්තියේ විධිවිධාන, IV වන කොටසේ, සහ 23, 36, 40, 41, 42, 43 සහ 44 වන වගන්තිවල විධිවිධාන, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 79 වන ව්‍යවස්ථාව ප්‍රකාරව මෙම පනත සම්බන්ධයෙන් සහතිකය පිටසන් කරනු ලබන දිනයේ සිට බලාත්මක විය යුතුය.

(3) පොදු අධිකාරීන් හෝ පොදු අධිකාරීන්හි ප්‍රභේද සම්බන්ධයෙන් වූ, මේ පනතේ වෙනත් සියලු වගන්තිවල සඳහන් විධිවිධාන අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මඟින් නියම කරනු ලැබිය හැකි දිනවල දී බලාත්මක වන්නේ ය.

එසේ වුව ද, එසේ නියම කරනු ලබන දිනය ඉහත (2) වන උපවගන්තියේ සඳහන් සහතිකය සටහන් කිරීමේ දිනයෙන් පසුව අවම වශයෙන් මාස හයක් ඇතුළත විය යුතු අතර, එම සහතිකය සටහන් කිරීමේ සිට එක් අවුරුද්දකට වඩා වැඩි නොවන කාලයක දී මේ පනතේ විධිවිධාන සියලු පොදු අධිකාරීන් සඳහා අදාළ වන්නේ ය.

"සංශෝධනය පිළිගත යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතුය", යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

2 වැනි වගන්තිය සභා සම්මත විය.

3 වැනි වගන්තිය

පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමා යෝජනා කළ සංශෝධනයක් : 2 වැනි පිටුවේ 6 වන පේළියට ඉක්බිතිවම ආදේශ කිරීමට,—

> "(2) මෙම පනතේ විධිවිධාන පාර්ලිමේන්තු බලතල, වරප්‍රසාද සහ පරිවයන් හීන කරනු නොලබන්නේය.";

"සංශෝධනය පිළිගත යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

''වගන්තිය සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතුය'', යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

4 වැනි වගන්තිය සභා සම්මත විය.

5 වැනි වගන්තිය

පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමා යෝජනා කළ සංශෝධනයක් : 4 වැනි පිටුවේ 26 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

''කිරීමක් හෝ අධිකරණයේ අධිකාරී බලය හා අපක්ෂපාතීබව පවත්වාගෙන යාමට අගතියක් සිදු වන අවස්ථාවක දී;'';

''සංශෝධනය පිළිගත යුතුය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමා යෝජනා කළ තවත් සංශෝධනයක් : 4 වැනි පිටුවේ 28 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

''හෝ නීතිය මඟින් විධිවිධාන සලස්වා ඇති ආකාරයට පළාත් සභා වරප්‍රසාද උල්ලංඝනය කිරීමක් වන අවස්ථාවක දී;''

''සංශෝධනය පිළිගත යුතුය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමා යෝජනා කළ තවත් සංශෝධනයක් : 4 වැනි පිටුවේ 31 වන පේළියට ඉක්බිතිවම පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

''(ක) එම තොරතුරු තීරණයක් ගෙන නොමැති අමාත්‍ය මණ්ඩල සංදේශයක් සම්බන්ධයෙන් වන අවස්ථාවකදී; හෝ

(ග) එම තොරතුරු අදාළ මැතිවරණ නීති මඟින් රහසිගතව තැබීමට නියමිත වන්නා වූ මැතිවරණ කොමසාරිස්වරයා විසින් පවත්වනු ලබන මැතිවරණයකට සම්බන්ධ තොරතුරු වන අවස්ථාවක දී,'';

''සංශෝධනය පිළිගත යුතුය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමා යෝජනා කළ තවත් සංශෝධනයක් : 5 වැනි පිටුවේ 14 වන පේළිය ඉවත්කර පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

''ප්‍රතික්ෂේප නොකළ යුතුය;'';

''සංශෝධනය පිළිගත යුතුය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමා යෝජනා කළ තවත් සංශෝධනයක් : 5 වැනි පිටුවේ 15 වන පේළියේ සිට 18 වන පේළිය දක්වා ඇති පේළි (ඒ පේළි දෙක ද ඇතුලත් ව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

''(5)(1) උපවගන්තිය යටතේ හෙළිදරව් කිරීමෙන් මුක්ත කර ඇති තොරතුරක් වෙත ප්‍රවේශවීම ප්‍රදානය කිරීමට අදාළ යම් ගැටලුවක් පිළිබඳව තොරතුරු නිලධරයකු විසින් කොමිෂන් සභාවෙන් උපදෙස් ලබාගත හැකි අතර, කොමිෂන් සභාව විසින් හැකි ඉක්මණින් සහ එවැනි සෑම අවස්ථාවක දී ම දින දාහතරක් ඇතුළත ස්වකීය උපදෙස් ලබා දිය යුතු ය.'';

''සංශෝධනය පිළිගත යුතුය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

''වගන්තිය සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතුය'', යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

6 වැනි වගන්තිය සභා සම්මත විය.

7 වැනි වගන්තිය

පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමා යෝජනා කළ සංශෝධනයක් : 5 වැනි පිටුවේ 28 වන පේළියේ සිට 31 වන පේළිය දක්වා ඇති පේළි (ඒ පේළි දෙක ද ඇතුලත් ව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

''7(1) මේ පනතේ විධිවිධාන සලසා ඇති ආකාරයට තොරතුරුවලට ප්‍රවේශවීමට ඇති අයිතිවාසිකම සුසාදනය කිරීම සඳහා නිසි අයුරින් සාදනු ලබන නාමාවලි සහ සූචියක් අනුව එහි ක්‍රියාත්මකවීමේ අවශ්‍යතා සමඟ අනුකූල වන ආකාරයට සහ ආකෘතියකට අනුව සෑම පොදු අධිකාරියක් විසින්ම සිය වාර්තා පවත්වාගෙන යෑම ඒ සෑම පොදු අධිකාරියක ම වගකීම වන්නේ ය.'';

''සංශෝධනය පිළිගත යුතුය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමා යෝජනා කළ තවත් සංශෝධනයක් : 6 වැනි පිටුවේ 13 වන පේළියට ඉක්බිතිවම පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

''(4) මේ පනත යටතේ ඉදිරිපත් කරන ලද යම් ඉල්ලීමක විෂය වස්තුව වන්නා වූ කිසිදු වාර්තාවක් හෝ තොරතුරක්, එම ඉල්ලීම හෝ එම ඉල්ලීමට අදාළ යම් අභියාචනයක් විභාගවන අතරතුර දී හෝ අධිකරණ කටයුත්තක් පවතින කාලය තුළ දී විනාශ නොකළ යුතු ය. '';

''සංශෝධනය පිළිගත යුතුය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

''වගන්තිය සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතුය'', යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

8 වැනි වගන්තිය

පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමා යෝජනා කළ සංශෝධනයක් : 6 වැනි පිටුවේ 22 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

''පුරවැසියකුට මේ පනතේ 3 වන වගන්තිය යටතේ ප්‍රදානය කොට'';

''සංශෝධනය පිළිගත යුතුය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමා යෝජනා කළ තවත් සංශෝධනයක් : 7 වැනි පිටුවේ 26 වන පේළියේ සිට 28 වන පේළිය දක්වා ඇති පේළි (ඒ පේළි දෙක ද ඇතුලත් ව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

> ''(අ) රාජ්‍ය භාෂාවලින් පළ කරනු ලැබිය යුතු අතර, විද්‍යුත් ලේඛණාකෘතියකින් ලබා ගැනීමට කටයුතු සැලැස්විය යුතු ය; සහ'';

''සංශෝධනය පිළිගත යුතුය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමා යෝජනා කළ තවත් සංශෝධනයක් : 8 වැනි පිටුවේ 4 වන පේළියට ඉක්බිතිවම පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

> ''සැක දුරු කිරීමේ කාර්යය සඳහා අමාත්‍යවරයා යන යෙදුම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ XVIIඅ පරිච්ඡේදය යටතේ පිහිටුවා ඇති පළාත් සභාවක අමාත්‍යවරයකු ද ඇතුළත් වන බවට මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.'';

''සංශෝධනය පිළිගත යුතුය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

''වගන්තිය සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතුය'', යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

9 වැනි වගන්තිය

පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමා යෝජනා කළ සංශෝධනයක් : 8 වැනි පිටුවේ 10 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

> ''සන්නිවේදනය කිරීම, එම අමාත්‍යවරයාගේ කාර්යය වන්නේ ය:
>
> එසේ වුව ද, හදිසි ව්‍යාපෘතියක් සම්බන්ධයෙන් වනවිට, එම ව්‍යාපෘතිය ආරම්භ කිරීමට සතියකට පෙරාතුව තොරතුරු ලබාදිය යුතු අතර, එම හදිසි තත්ත්වය සඳහා හේතු කොමිෂන් සභාව වෙත සන්නිවේදනය කරනු ලැබිය යුතු ය.'';

''සංශෝධනය පිළිගත යුතුය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමා යෝජනා කළ තවත් සංශෝධනයක් : 8 වැනි පිටුවේ 16 වන පේළියේ සිට 18 වන පේළිය දක්වා ඇති පේළි (ඒ පේළි දෙක ද ඇතුලත් ව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

> ''ඇති ව්‍යාපෘතියක් සම්බන්ධ යාවත්කාලීන තොරතුරු පුරවැසියකු විසින් තත් කාර්යය සඳහා ලිඛිතව කරනු ලබන ඉල්ලීමක් මත එම පුරවැසියාට ලැබීමට සැලැස්විය යුතු ය.'';

''සංශෝධනය පිළිගත යුතුය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමා යෝජනා කළ තවත් සංශෝධනයක් : 8 වැනි පිටුවේ 24 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

"විට, එක්සත් ජනපද ඩොලර් ලක්ෂ එකක් ඉක්මවන;";

"සංශෝධනය පිළිගත යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමා යෝජනා කළ තවත් සංශෝධනයක් : 8 වැනි පිටුවේ 28 වන පේළියට ඉක්බිතිවම පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

"සැක දුරු කිරීමේ කාර්ය සඳහා අමාත්‍යවරයා යන යෙදුම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ XVIIඅ පරිච්ඡේදය යටතේ පිහිටුවා ඇති පළාත් සභාවක අමාත්‍යවරයකු ද ඇතුළත් වන බවට මෙයින් ප්‍රකාශයට පත් කර සිටිනු ලැබේ.";

"සංශෝධනය පිළිගත යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතුය", යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

10 වැනි වගන්තිය

පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමා යෝජනා කළ සංශෝධනයක් : 8 වැනි පිටුවේ 30 වන පේළියේ සිට 32 වන පේළිය දක්වා ඇති පේළි (ඒ පේළි දෙක ද ඇතුළත් ව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

"සපයමින් එහි කාර්යාලයේ දී සහ ස්වකීය නිල වෙබ් අඩවියෙහි මහජනතාවගේ ප්‍රයෝජනය සඳහා තැබිය යුතු වාර්ෂික වාර්තා, එකී වාර්තා අදාළ වන වර්ෂයට ඉක්බිතිව ම එළඹෙන වර්ෂයේ දෙසැම්බර් මස තිස් එක් වන දිනයට පෙරාතුව කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය:-";

"සංශෝධනය පිළිගත යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමා යෝජනා කළ තවත් සංශෝධනයක් : 9 වැනි පිටුවේ 9 වන පේළියට ඉක්බිතිවම පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

"(ඊ) තොරතුරු සන්නිවේදනය කිරීම, ප්‍රතික්ෂේප කිරීම මඟින් පැන නගින අභියාචනා සංඛ්‍යාව;

(උ) වාර්තා පවත්වාගෙන යෑම, කළමනාකරණය සහ විනාශ කිරීමට අදාළ පරිචයන්; සහ

(ඌ) 8 වන වගන්තිය යටතේ ස්වකීය කර්තව්‍යයන්.";

"සංශෝධනය පිළිගත යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතුය", යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

11 වැනි වගන්තිය සභා සම්මත විය.

12 වැනි වගන්තිය

පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමා යෝජනා කළ සංශෝධනයක් : 9 වැනි පිටුවේ 27 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

> "(අ) නීතිඥවරුන් සහ නීති ක්ෂේත්‍රයේ විද්වත් ප්‍රජාව විමසා නීතිඥ වෘත්තියේ ප්‍රවීණත්වයක් ඇති නීතිඥවරයෙක් හෝ නීති විශාරදයෙක් නම් කළ යුතු ශ්‍රී ලංකා නීතිඥ සංගමය";

"සංශෝධනය පිළිගත යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතුය", යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

13 වැනි වගන්තිය සිට 18 වැනි වගන්තිය දක්වා සභා සම්මත විය.

19 වැනි වගන්තිය

පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමා යෝජනා කළ සංශෝධනයක් : 15 වැනි පිටුවේ 4 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

> "සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු අතර, මේ පනත යටතේ";

"සංශෝධනය පිළිගත යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමා යෝජනා කළ තවත් සංශෝධනයක් : එහි පැති සටහන ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

> "කොමිෂන් සභාවේ සාමාජිකයන් ආදීන් රජයේ සේවකයන් විය යුතු බව."

"සංශෝධනය පිළිගත යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතුය", යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

20 වැනි වගන්තිය සිට 24 වැනි වගන්තිය දක්වා සභා සම්මත විය.

25 වැනි වගන්තිය

පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමා යෝජනා කළ සංශෝධනයක් : 18 වැනි පිටුවේ 19 වන පේළිය සහ 20 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

> "(3) තොරතුරු ලබා ගැනීම සඳහා වන ඉල්ලීම, යම් පුරවැසියකුගේ ජීවිතය සහ පුද්ගලික නිදහස සම්බන්ධයෙන්";

''සංශෝධනය පිළිගත යුතුය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

''වගන්තිය සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතුය'', යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

26 වැනි වගන්තිය

පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමා යෝජනා කළ සංශෝධනයක් : 19 වැනි පිටුවේ 25 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

> ''සහ එම පොදු අධිකාරියේ වෙබ් අඩවියක් ඇත්නම් එම වෙබ් අඩවියේ නිවේදනයක් ප්‍රදර්ශනය කරනු ලැබිය යුතු ය:-'';

''සංශෝධනය පිළිගත යුතුය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

''වගන්තිය සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතුය'', යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

27 වැනි වගන්තිය සිට 30 වැනි වගන්තිය දක්වා සභා සම්මත විය.

31 වැනි වගන්තිය

පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමා යෝජනා කළ සංශෝධනයක් : 23 වැනි පිටුවේ 15 වන පේළියට ඉක්බිතිවම පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

> ''එසේ වුව ද, අභියාචකට පාලනය කළ නොහැකි හේතුවක් නිසා අභියාචනය ගොනු කිරීමෙන් අභියාචක වළක්වා ඇති බවට නම් කළ නිලධරයා සෑහීමට පත් වේ නම් පමණක් දින දාහතරක කාලසීමාව අවසන්වීමෙන් පසුව ඔහු හෝ ඇය විසින් එම අභියාචනය පිළිගනු ලැබිය හැකි ය.''

''සංශෝධනය පිළිගත යුතුය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

''වගන්තිය සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතුය'', යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

32 වැනි වගන්තිය සිට 33 වැනි වගන්තිය දක්වා සභා සම්මත විය.

34 වැනි වගන්තිය

පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමා යෝජනා කළ සංශෝධනයක් : 25 වැනි පිටුවේ 5 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

> ''සිට මාසයක් ඇතුළත අභියාචනාධිකරණය වෙත අභියාචනයක්'';

''සංශෝධනය පිළිගත යුතුය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

''වගන්තිය සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතුය'', යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

35 වැනි වගන්තිය සිට 37 වැනි වගන්තිය දක්වා සභා සම්මත විය.

38 වැනි වගන්තිය

පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමා යෝජනා කළ සංශෝධනයක් : 27 වැනි පිටුවේ 3 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

"පිළිබඳව මාසයක කාලයක් ඇතුලත කොමිෂන් සභාව වෙත දැනුම් දිය යුතු ය.";

"සංශෝධනය පිළිගත යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතුය", යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

39 වැනි වගන්තිය සභා සම්මත විය.

40 වැනි වගන්තිය

පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමා යෝජනා කළ සංශෝධනයක් : 28 වැනි පිටුවේ 23 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

"මේ පනත යටතේ";

"සංශෝධනය පිළිගත යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතුය", යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

41 වැනි වගන්තිය

පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමා යෝජනා කළ සංශෝධනයක් : 28 වැනි පිටුවේ 31 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

"මේ පනතේ මූලධර්ම සහ විධිවිධාන බලාත්මක කිරීම සඳහා නියෝග සෑදීම";

"සංශෝධනය පිළිගත යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතුය", යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

42 වැනි වගන්තිය සභා සම්මත විය.

43 වැනි වගන්තිය

පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමා යෝජනා කළ සංශෝධනයක් : 31 වැනි පිටුවේ 14 වන පේළිය සිට 17 වන පේළිය දක්වා ඇති පේළි (ඒ පේළි දෙක ද ඇතුලත් ව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

"(ඉ) සිය කොටස්වලින් සියයට විසිපහක් හෝ ඉන් වැඩි ප්‍රමාණයක් හෝ අන්‍යාකාරයකින් පාලන අයිතියක් ඇති රජය හෝ රාජ්‍ය සංස්ථාවක් හෝ

රජය සහ රාජ්‍ය සංස්ථාවක් එකතුව දරනු ලබන සහ 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ සංස්ථාගත කරන ලද සමාගමක්'';

''සංශෝධනය පිළිගත යුතුය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමා යෝජනා කළ තවත් සංශෝධනයක් : 32 වැනි පිටුවේ 7 වන පේළිය සහ 8 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

''(ඒ) යම් ලිඛිත නීතියක් යටතේ පිහිටුවන ලබන, හඳුනාගනු ලබන හෝ බලපත්‍රයක් ලබා දෙනු ලබන හෝ රජය මඟින් හෝ රාජ්‍ය සංස්ථාවක් මඟින් හෝ පළාත් සභා ප්‍රඥප්තියක් යටතේ පිහිටුවනු ලබන හා ඇති කරනු ලබන යම් ව්‍යවස්ථාපිත මණ්ඩලයක් මඟින් පූර්ණ වශයෙන් හෝ අර්ධ වශයෙන් මූල්‍යාධාර සපයන පෞද්ගලික විශ්වවිද්‍යාල සහ වෘත්තීය ආයතන ඇතුළු උසස් අධ්‍යාපන ආයතන;'';

''සංශෝධනය පිළිගත යුතුය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමා යෝජනා කළ තවත් සංශෝධනයක් : 32 වැනි පිටුවේ 9 වන පේළියේ සිට 10 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

''(ඕ) යම් ලිඛිත නීතියක් යටතේ පිහිටුවනු ලබන, පිළිගනු ලබන හෝ බලපත්‍රයක් ලබා දෙනු ලබන හෝ රජය මඟින් හෝ රාජ්‍ය සංස්ථාවක් මඟින් හෝ පළාත් සභා ප්‍රඥප්තියක් යටතේ පිහිටුවනු ලබන හා ඇති කරනු ලබන යම් ව්‍යවස්ථාපිත මණ්ඩලයක් මඟින් පූර්ණ වශයෙන් හෝ අර්ධ වශයෙන් මූල්‍යාධාර සපයන වෘත්තීය හෝ කාර්මික අධ්‍යාපනය ලබා දෙන ආයතන ඇතුළු පුද්ගලික අධ්‍යාපන ආයතන;'';

''සංශෝධනය පිළිගත යුතුය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමා යෝජනා කළ තවත් සංශෝධනයක් : 32 වැනි පිටුවේ 14 වන පේළියේ සිට 20 වන පේළිය දක්වා ඇති පේළි (ඒ පේළි දෙක ද ඇතුලත් ව) ඉවත් කරන්න.

''සංශෝධනය පිළිගත යුතුය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

''වගන්තිය සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතුය'', යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

44 වැනි වගන්තිය සභා සම්මත විය.

**උපලේඛනය**

''උපලේඛනය පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතුය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**පූර්විකාව**

''පූර්විකාව පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතුය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**ප්‍රඥප්ති වගන්තිය හා නාමය**

''ප්‍රඥප්ති වගන්තිය හා නාමය පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතුය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත සංශෝධන සහිතව වාර්තා කරන ලදී.

''පනත් කෙටුම්පත දැන් සංශෝධිතාකාරයෙන් තුන්වැනි වර කියවිය යුතුය''යි පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමා යෝජනා කළේය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත, ඊට අනුකූලව, සංශෝධිතාකාරයෙන් තුන්වැනි වර කියවා සම්මත කරන ලදී.

**4. කල් තැබීම :** ''මෙම පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය''යි පාර්ලිමේන්තුවේ සභානායකතුමා යෝජනා කළේය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය; අ. භා. 4.16 ට, 2016 ජූලි මස 05 වැනි අඟහරුවාදා අ. භා. 1.00 වනතෙක් පාර්ලිමේන්තුව කල් ගියේය.